සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 07 - 2023

## කතෝලික ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

### I - කොටස

- අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) ජපමාලයේ දී උච්ඡාරණය කරනු ලබන "ආලෝකයේ අභිරහස්" හඳුන්වා දුන්නේ,

1. V වන පියුස් ශුද්ධෝත්තම පියතුමා.
2. සාන්ත ඩොමිනික් ගුස්මාන් පියතුමා.
3. II වන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා.
4. XI වන ක්ලෙමන්ට් ශුද්ධෝත්තම පියතුමා.

02) පාද නමස්කාරයේදී ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයේ විශේෂ සිදුවීම් සිහිපත් කරන ස්ථාන ගණන,

1. 14 කි.
2. 11 කි.
3. 12 කි.
4. 10 කි.

03) ආශිර්වාදකාර බන්ධනය නැමැති දේව ප්‍රසාද නිධානය,

1. ජනතා සේවයේ ප්‍රසාද නිධානයකි.
2. ආරම්භක දේව ප්‍රසාද නිධානයකි.
3. සුවදානයේ දේව ප්‍රසාද නිධානයකි.
4. එක් වරක් පමණක් ලැබිය හැකි ප්‍රසාද නිධානයකි

04) විජයග්‍රහණයේ අප ස්වාමිදුවගේ මංගල්‍ය සමරනු ලබන්නේ,

1. ජනවාරි 01.
2. අගෝස්තු 08.
3. ඔක්තෝම්බර් 07.
4. දෙසැම්බර් 08.

05) ප්‍රසාද ස්නාපන පිළිවෙතේ අත්‍යවශ්‍ය හා අනිවාර්ය පිළිවෙත වන්නේ,

1. ප්‍රසාද ස්නාපන පෙරොන්දු දීම.
2. හිස මත ජලය වත්කරමින් ප්‍රසාද ස්නාපනය කිරීම.
3. ක්‍රිස්මා තෛලයෙන් ආලේප කිරීම.
4. දරුවගේ හිස මත අත තබා යැදීම.

06) "බෙතෙල්" යන වචනයෙහි අර්ථය වනුයේ,

1. ස්වාමීන් වහන්සේ අප සමඟය.
2. දෙවියන් වහන්සේ මා හිනැස්සූ සේක යන්නය.
3. පෙනුයෙල්හි දර්ශනය වීමය.
4. "දෙවියන් වහන්සේගේ ගෘහය" යන්නය.

07) "සමාජ සාධාරණත්වයේ" දිවැසිවරයා වනුයේ,

1. හොසියා දිවැසිවරයාය.
2. ආමෝස් දිවැසිවරයාය.
3. ජෝනා දිවැසිවරයාය.
4. මීකා දිවැසිවරයාය.

08) ජේසුස් වහන්සේ රේගු පොළේදි තෝරාගත් ශ්‍රාවකයා වන්නේ,

1. ශු.ජාකෝබ් තුමා.
2. ශු.ඇන්ඩෘ තුමා
3. ශු.ජුවාම් තුමා.
4. ශු.මතෙව් තුමා.

09) පාදනමස්කාර භක්ති අභ්‍යාසයේදී අප සිහිපත් කරන්නේ,

1. ක්‍රිස්තුන් වහන්සේගේ මල් උයනේ යාච්ඤාවයි.
2. ක්‍රිස්තුන් වහන්සේව කුරුසයේ ඇණ ගැසීමයි.
3. ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම හා උකුත්වීමයි.
4. ක්‍රිස්තුන් වහන්සේගේ උකුත්වීමයි.

10) ජේසුස් වහන්සේ තම ප්‍රේම කළ ශ්‍රාවකයාට තම මව වන මරියතුමිය භාර දෙන්නේ කුමන අවස්ථාවේද?

1. කුරුස ගසේ දී.
2. අන්තිම රාත්‍රී භෝජන අවස්ථාවේදී.
3. කන්ද උඩ දේශනාවේදී.
4. පාද දොවනයේදී.

(ලකුණු : 2x10 = 20)

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ලියන්න.**

11) ප්‍රසාද ස්නාපනය මගින් අපද .......................................... ජීවිතයකය ඇතුළු වේ.

12) ශුද්ධ වූ පැය ජේසුස් වහන්සේම .................................. මගින් ආරම්භ කළ භක්ති අභ්‍යාසයකි.

13) යාම යැදුම සඳහා .................................... පදනම කර ගනී.

14) .................................... දිවැසිවරයාගේ විවාහ ජීවිතයම එක්තරා ආකාරයක දිවැසිවර පණිවිඩයක් විය.

15) ආබ්‍රහම තුමාගෙන් පැවත ආ ජනතාව චර්මඡේදනය කළද අද අපව .......................................... කරයි.

(ප්‍රසාද ස්නාපනය, හොසියා, ගිතාවලිය, ගිව්සුම්, ශුද්ධ වූ මර්ගරිතා මරිය තුමිය)

(ලකුණු : 2x5 = 10)

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදිනම් ( ✓) ලකුණ ද වැරදිනම් ( ✕ ) ලකුණ ද යොදන්න.**

16) ජපමාලයේ අභිරහස් වර්ග 05 කි. ( )

17) ජේසුස් වහන්සේ ගලීල මුහුදු වෙරළෙහි ඇවිදිමින් සිටියදී ප්‍රථම ශ්‍රාවකයෝ කැඳ වූ සේක. ( )

18) "ආබ්‍රම්" යන නමේ අර්ථය "උතුම් පියා" යන්නයි. ( )

19) දාවිත් රජතුමාට එලියා දිවැසිවරය තම වරද පෙන්වා දුන් සේක. ( )

20) පූජකවරය ජීවිතයේ එකවරක් පමණක් ලබාගත හැකි දේව ප්‍රසාද නිධානයකි. ( )

(ලකුණු : 2x5 = 10)

## II - කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01) i. ආබ්‍රහම් තුමාට මුහුණදීමට සිදු වූ අභියෝග 02 ක් ලියන්න.
ii. පදවි පූජකවරු ලබා ගන්නා පොරොන්දු 02 ක් නම් කරන්න.
iii. යදින අවස්ථාව අනුව නම් කරනු ලබන යාම යැදුම් 02 ක් ලියන්න.
iv. ආදි පිතෘ ජාකෝබ් තුමා දුටු දර්ශන දෙක ලියන්න.
v. ශ්‍රී ලංකාව තුළ ඔබට යා හැකි වන්දනා සිද්ධස්ථාන 02 ක් ලියන්න.
vi. පාද නමස්කාරයේ තුන්වන හා හතරවන ස්ථාන දෙක ලියන්න.
vi. ජපමාලයේ භාවිතා කරන අභිරහස් වර්ග දෙකක් ලියන්න.
viii. විවහ ගිවිසුවේ පාර්ශව දෙක ලියන්න.
ix. සත්වන හා අටවන දේව පණත් දෙක නම් කරන්න.
x. කිතුනු විවහයේ ලක්ෂණ දෙක ලියන්න. (ලකුණු : 2 x 10 = 20)

02) i. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බැහැදැකිමේ පරමාර්ථ 02 ක් ලියන්න. (ල. 02)
ii. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බැහැදැකිය හැකි අවස්ථා 03 ක් ලියන්න. (ල. 03)
iii. දෙව්මැදුර තුළ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තැන්පත් කර ඇතිවිට හැසිරිය යුතු ආකාර 05 ක් ලියන්න. (ල. 05)

03) i. "විජයග්‍රහනයේ අප ස්වාමිදුවගේ මංගල්‍යය" ජපමාල මංගල්‍ය ලෙස වෙනස් කරන ලද්දේ කවුරුන් විසින්ද? (ල.02)
ii. සාමාන්‍ය ජපමාලය උච්ඡාරණය කරන විට භාවිත කරන යැදුම් 03 ක් ලියන්න. (ල. 03)
iii. ජපමාලය උච්ඡාරණය කිරීම තුළින් කිතුනු ඔබට ලැබෙන වරප්‍රසාද 05 ක් ලියන්න. (ල. 05)

04) i. ප්‍රසාද ස්නාපනයේ දී ක්‍රිස්මා තෛලයෙන් ආලේප කිරිමෙන් අප ලබන වගකීම් (කැදවීම්) 02 ක් ලියන්න. (ල. 02)
ii. පොදු පූජකවරයෙන් පැවරෙන වගකීම් ඉටුකිරීමට සහාය වන සමිති සමාගම් 03 ක් ලියන්න. (ල. 03)
iii. පොදු පූජකවරයෙන් ඔබට ලැබෙන වගකීම් 05 ක් ලියන්න. (ල. 05)

05) i. පැවිදි නිකායන් බෙදෙන ප්‍රධාන කොටස් 02 ක නම් කරන්න. (ල. 02)
ii. පැවිදි පූජකවරු ලබා ගන්නා වේදහාර 03 ක් ලියන්න. (ල. 03)
iii. පූජකවරුන්ගේ කැදවීම වඩාත් සාර්ථක කර ගැනීමට අවශ්‍ය ශක්තිය පතා යාච්ඤාවක් නිර්මාණය කරන්න. (ල. 05)

06) i. ජේසුස් වහන්සේ තෝරාගත් ගෝලයෝ දොළොස්දෙනා හැදින් වූ නම් 02 ක් ලියන්න. (ල. 02)
ii. ජේසුස් වහන්සේ අනුව ගිය ප්‍රථම ශ්‍රාවකයෝ තිදෙනෙක් නම් කරන්න. (ල. 03)
iii. කිතුනු ශ්‍රාවකයෙකු ලෙස ඔබ පාසල තුළ ක්‍රියාකරන අකාර 05 ක් ලියන්න. (ල. 05)

07) i. දිවැසිවරයා හඳුන්වන හේබ්‍රෙව් වචනය හා එහි අර්ථය ලියන්න (ල. 02)
ii. ප්‍රධාන දීවැසිවරු තිදෙනා නම් කරන්න. (ල. 03)
iii. දිවැසිවරයෙකු ලෙස ඔබට කළ හැකි කාර්යයන් 05 ක් ලියන්න. (ල. 05)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 07 - 2023

## කතෝලික ධර්මය – පිළිතුරු පත්‍රය

නම / විභාග අංකය:

**I - කොටස**

| | | | |
|---|---|---|---|
| 1 - 3 | 6 - 4 | 11 - ගිවිසුම්. | 16 - (x) |
| 2 - 1 | 7 - 2 | 12 - ශුද්ධ වූ මර්ගරිතා මරියතුමිය. | 17 - (✓) |
| 3 - 1 | 8 - 4 | 13 - ගිතාවලියේ ය. | 18 - (✓) |
| 4 - 3 | 9 - 3 | 14 - හොසියා. | 19 - (x) |
| 5 - 2 | 10 - 1 | 15 - ප්‍රසාද ස්නාපනය. | 20 - (✓) |

(ල 2 x 20 = 40)

**II - කොටස**

01) i. විශාල ජාතියක් ඇති කිරීම.
නොදන්නා දේශයකට යාමට සිදුවීම.
සංචාරක ජීවිතයක් ගත කිරීමට සිදු වීම.

ii. කීකරුකම.
පූජක බඹසර.

iii. උදා යාම යැදුම. දිවා යාම යැදුම.
සැඳෑ යාම යැදුම. රාත්‍රී යාම යැදුම.

iv. බෙතෙල්හි දර්ශනය.
පෙනුයෙල්හි දර්ශනය.

v. මරුද මඩු දේවමාතා සිද්ධස්ථානය. තලවිල සාන්ත ආනා සිද්ධස්ථානය.
තේවත්ත ලංකා අප ස්වාමි දුවගේ බැසිලිකාව. මාතර ජයලත් අප ස්වාමිදුගේ සිද්ධස්ථානය.

vi. තුන්වන ස්ථානය : ජේසු ස්වාමිදරුවෝ පළමු වර බිම වැටෙන සේක.
හතරවන ස්ථානය : ජේසුස් ස්වාමිදරුවන්ට උන්වහන්සේගේ පිරිසිදු මෑණියෝ සම්මුඛ වන සේක.

vii. සොම්නස් අභිරහස්. මෝක්ෂ අභිරහස්.
දොම්නස් අභිරහස්. ආලෝකයේ අභිරහස්.

viii. මනාලයා හා මනාලිය යි.

ix. සත්වන පනත : සොරකම් නොකරව.
අටවන පනත : බොරු සාක්ෂි නොකියව.

x. ඒකත්වය.
අඛණ්ඩත්වය.

(ල 2 x 10 = 20)

02) i. අපගේ උතුම්ම වන්දනාව පුද කිරිමට.

යාච්ඤාව තුළින් උන්වහන්සේ හා ගැඹුරු සබඳතාවක් පවත්වාගෙන යාමට.

අපගේ අධ්‍යාත්මික හා ලෞකික අවශ්‍යතා ඉල්ලා ගැනීමට.

අපගේ ජීවිතයේ ජයග්‍රහණ හා දුක්වේදනා උන්වහන්සේ හමුවේ තැබීමට.

අපට ලැබුණා වූ සියලු දේව වරප්‍රසාදවලට තුති පිදීමට. (ල. 02)

ii. හැකි සෑම අවස්ථාවකදීම.

දේවස්ථානයේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩමවා ඇති විට.

දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව පවත්වන විට.

දේවස්ථානය අසලින් යන සෑම අවස්ථාවකම.

අපගේ අවශ්‍යතා උන්වහන්සේ හමුවේ තබන විට. (ල. 03)

iii. දේවස්ථානය තුළ නිශ්ශබ්දතාවය සුරැකිම. (ල. 05)

දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට දණ නමා නමස්කාර කිරීම.

උන්වහන්සේ අභියස යාච්ඤාවේ හා භාවනාවේ නිරත විම.

දේවස්ථානය තුළ ආහාර පාන ගැනීමෙන් වැළකීම.

දේවස්ථානය ඇතුළත සංවර ලෙස ගමන් කිරීම.

(ආදී සිසුවා ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න) (ලකුණු : 2+3+5 = 10)

03) i. අති උතුම් දහතුන්වන ග්‍රෙගරි ශුද්ධෝත්තම පියතුමා. (ල. 02)

ii. සාන්ත කුරුසයේ ලකුණ.

විශ්වාස ලක්ෂණය.

සකලගුණ සම්පන්න යැදුම.

මංගල්‍ය ආරාධනාව.

අහෝ මාගේ දෙවිවුනි යැදුම. (ල. 03)

iii. අපගේ ජීවිතවලට එල්ලවන අභියෝග ජය ගත හැකි වීම.

වරප්‍රසාදයෙන් පිරුණු කිතුනු දිවියකට හිමිකම් කීම.

පවුලේ බැඳීම ශක්තිමත් වීම.

පවුලට ආශිර්වාදය ලැබීම.

දේව ජීවිතය ශක්තිමත් වීම..... ආදී පිළිතුරු. (ලකුණු : 2+3+5 = 10)

04) i. එඬේරික.

පූජක.

දිවැසිවර. (ල. 02)

ii. ධර්මදූත ළමා සමාජය.

පූජා උදව් සමිතිය.

ළමා ක්‍රියාකාරී වීරයෝ.

ගිතිකා කණ්ඩායම. (ල. 03)

iii. දේවමාතා වචනයට සාක්ෂි දැරීම.

සත්‍යය ප්‍රකාශ කිරීම.

දේව වාක්‍ය කියවීම.

එකිනෙකා වෙනුවෙන් යැදීම.

ආගමික සමිති සමාගම්වල නිලතල භාර ගෙන වගකීමෙන් කටයුතු කිරීම. (පිටු අංක 56) (ල. 05)

(ලකුණු : 2+3+5 = 10)

05) i. පැවිදි පූජක.
පූජක නොවන පැවිදි. (ල. 02)
ii. දිළිඳුකම.
කීකරුකම.
වුත ශුද්ධිය. (ල. 03)
iii. (සිසුවා ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු ලබා දෙන්න.) (ල. 05)
(ලකුණු : 2+3+5 = 10)

06) i. ප්‍රේරිතයෝ.
අපෝස්තුලුවරු. (ල. 02)
ii. පේදුරු.
ඇන්ඩෘ.
ජාකොබ්. (ල. 03)
iii. ක්‍රිස්තුන් වහන්සේ ඉගැන්වූ ධර්මය ආරක්ෂා කිරීම.
අන් අය සමඟ දේව වචනය බෙදා හැරීම.
ධර්ම දූත සේවයේ නිරත වීම.
නොකඩවා ජනවන්දනාවට සහභාගී වීම.
දේව වචනය කියවීම, මෙනෙහි කිරීම හා ඒ අනුව ජීවත් වීම. (ල. 05)
(ආදී පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.) (පිටු අංක 40) (ලකුණු : 2+3+5 = 10)

07) i. නබී.
ප්‍රොෆෙටෙස්. (අර්ථය = දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කරන තැනැත්තා) (ල. 02)
ii. යෙසායා.
ජෙරමියා.
එසකියෙල්. (ල. 03)
iii. සත්‍යවාදීව කටයුතු කිරීම.
නිවැරදි දේ කිරීමෙන් අන් අයට මඟ පෙන්වීම.
සත්‍යවසන් කරන  අයට අභියෝග කිරීම.
වැරදි මාර්ගවලට ඇදී යන පුද්ගලයන්ට නිවැරදි මාර්ගයට ගැනීම.
ශුද්ධ බයිබලයෙහි ඇති පණිවුඩ අන් අයට ප්‍රකාශ කිරීම. (ල. 05)
(ලකුණු : 2+3+5 = 10)

(8) WWW.PastPapers.WiKi (7)
Download Term Test Papers, Short Notes From One Place!

(8) WWW.PastPapers.WiKi (8)

Download Term Test Papers, Short Notes From One Place!


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
ඉතිහාසය
2013 - 2022
සංගීතය
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න